**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය - 2022**

**----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ වාහන දීමනා වියදම රු.2,383,333 ක් වුව ද, රු.2,433,633 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වාහන දීමනා වියදම රු.50,300 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම්වලට සම්බන්ධ උපචිත වියදම් පිළිබඳව නිවැරදි තොරතුරු ලබාගත හැකි නිලධාරියෙකු නොසිටි හෙයින් 2021 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ උපචිත වියදම් කිහිපයක් 2022 වර්ෂයේ උපචිත වියදම් ගිණුම්ගත කිරීමේදී ඇතුළත් වී ඇති බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු ය. |
| (ii) | 2021 දෙසැම්බර් මාසයට අදාළව සභාපති ඇතුළු අනෙකුත් කොමසාරිස්වරුන් සඳහා ගෙවිය යුතුව තිබූ මාසික දීමනාව වූ රු.169,840 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මාසික දීමනා වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම්වලට සම්බන්ධ උපචිත වියදම් පිළිබඳව නිවැරදි තොරතුරු ලබාගත හැකි නිලධාරියෙකු නොසිටි හෙයින් 2021 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ උපචිත වියදම් කිහිපයක් 2022 වර්ෂයේ උපචිත වියදම් ගිණුම්ගත කිරීමේදී ඇතුළත් වී ඇති බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2021 වර්ෂයට අදාළ වියදම් අයිතම 8 ක් සඳහා ගෙවන ලද රු.196,711 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම් වල දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම්වලට සම්බන්ධ උපචිත වියදම් පිළිබඳව නිවැරදි තොරතුරු ලබාගත හැකි නිලධාරියෙකු නොසිටි හෙයින් 2021 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ උපචිත වියදම් කිහිපයක් 2022 වර්ෂයේ උපචිත වියදම් ගිණුම්ගත කිරීමේදී ඇතුළත් වී ඇති බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු ය. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ වාහන දෙකක් කාර්යාලයට පවරාගෙන තිබුණ ද, එහි වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි. | වාහන 2 ක් 2022 වර්ෂයේදී කාර්යාලයට පවරාගෙන තිබුණද, වටිනාකම ලබා ගැනීමට නොහැකි වීමෙන් ගිණුම්ගත කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | වාහන තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතුකළ යුතු ය. |
| (v) | උපචිත වියදම් ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂය ආරම්භයේදි රු.3,843,088 ක උපචිත වියදම් පැවති අතර, වර්ෂය තුළදී රු.67,183 ක උපචිත වියදම් එකතුවී තිබුණ ද, එම එකතු වූ වටිනාකමට අදාළ අනෙක් සටහන පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. තවද, වර්ෂය තුළ උපචිත වියදම් රු.3,446,513 ක් පියවා වර්ෂ අවසානයට රු.463,758 ක් උපචිත වියදම් ලෙස දැක්වූ නමුත් එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම් යටතේ ගිණුම් ගත කරනු වෙනුවට ශුද්ධ වත්කම්වලට එකතු කර තිබුණි. | මෙවැනි වර්ගීකරණ දෝෂයන් සිදු නොවීමට වගබලා ගන්නා ලෙසට අදාළ නිලධාරියාට උපදෙස් දුන්බව දන්වා ඇත. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු ය. |

### 1.5.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| අධිකාරි බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට හානිපූර්ණ කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතුව තිබූ රු.663,015 ක මුදල සමාලෝචිත වර්ෂයේදී හානිපූර්ණ කාර්යාලයෙන් අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව ශුද්ධ වත්කම්වලින් අඩුකර කපා හැරීම හේතුවෙන් ශුද්ධ වත්කම් එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. තවද, අදාළ මුදල කපා හැරීමට ලද අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරිණි. | 2021 වර්ෂයට අදාළව ලැබිය යුතු රු.663,015 ක චෙක්පත 2022 වර්ෂයේදී ලැබුණු අතර, එය ගිණුම්ගත කිරීම පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයේ ගණකාධිකාරිගෙන් අසන ලදි. අමාත්‍යාංශයෙන් ලබාදෙන අක්මුදල්වලට වෙනත් ලැබීම් එකතු කළහොත් අග්‍රිම ගිණුම වරදින හෙයින් එම චෙක්පත අමාත්‍යාංශයට එවිය යුතු බව දන්වා සිටි අතර, ඒ අනුව ලෙජරයේ ගිණුම්වල තිබූ ලැබිය යුතු ආරක්ෂණ වියදම් ගිණුමේ ශේෂය සමුච්චිත අරමුදලට මාරු කළ බව දන්වා තිබුණි. | අදාළ මුදල හානිපූර්ණ කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කළ යුතු ය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදය | කාර්යාලය භාවිතා කරන වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | හැකි ඉක්මනින් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කිරීමට සටහන් කර ගත් බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2019 මැයි මස 31 දිනැති අංක 13/2008 (v) දරන සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛයේ කොන්දේසි උල්ලංඝණය කරමින් නිලධාරීන් දෙදෙනෙකුට රු.47,995 ක ඉන්ධන දීමනා වැඩිපුර ගෙවා තිබුණි. පෙට්‍රල් ලීටරයක මිල රු. 254 ක්ව පැවතියදී රු.338 ක් ලෙස ගණනය කිරීම හේතුවෙන් අප්‍රේල් මස නිලධාරියකු වෙනුවෙන් රු.12,180 ක් වැඩිපුර දීමනා ගෙවා තිබුණි. | සාවද්‍ය ලෙස ඉන්ධන මිල ගණනය කිරීම නිසා වැඩිපුර ගෙවා ඇති ඉන්ධන දීමනාව අදාළ නිලධාරීන්ගෙන් අයකර වාර්තා කිරීමට සටහන් කරගත් බවත්,<br>සාවද්‍ය ගෙවීම වන රු. 12,180 ක මුදල අදාළ නිලධාරීයාට දන්වා අයකර වාර්තා කිරීමට සටහන් කරගත් බවත් දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද PE/COP/POLI/CIRCULAR හා 2015 මැයි මස 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ PED1/2015 හි 3.5 ඡේදය | කාර්යාලයෙහි ප්‍රවාහන හා ඉන්ධන දීමනාව ලබාගන්නා නිලධාරීන් හතරදෙනෙකු චක්‍රලේඛ උපදෙස් උල්ලංඝණය කරමින් සංචිත වාහන භාවිතා කර තිබුණු අතර, ප්‍රවාහන දීමනාව ලබා ගන්නා නිලධාරීන් දෙදෙනෙකු විසින් 2022 ජනවාරි 25 සිට පෙබරවාරි 01 දක්වා උතුරු පලාතේ පැවති ජංගම සේවයකට සහභාගීවීම සඳහා සංචිත වාහන භාවිතා කිරීමට ඉඩකඩ තිබියදී කාර් රථ දෙකක් පුද්ගලික ආයතනයකින් කුලියට ලබා ගෙන තිබූ අතර, ඒ සඳහා රු.141,860 ක මුදලක් කාර්යාලය විසින් ගෙවා තිබුණි. | ප්‍රවාහන හා ඉන්ධන දීමනාව ලබාගන්නා නිලධාරීන්ට සංචිත වාහන ලබානොදීමට සටහන් කරගත් බවත්,<br>ජංගම සේවය ලෝක ව්‍යාප්ත කොවිඩ් වසංගතය පැවති කාලයේ දී තිබුණු අතර සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූල වෙමින් සෞඛ්‍යාරක්ෂිත ලෙස එම කටයුතුවලට සහභාගි විම සඳහා 2022 ජනවාරි 24 දින රැස් වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්‍රිකා අංක 06/2022 මඟින් විමර්ශන මණ්ඩලවල ප්‍රධානීන් ලෙස කටයුතු කරන ලද නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් ලබාදිමට කටයුතු කර තිබූ බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු රෙ 110 | මුදල් රෙගුලාසි පරිදි හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | මෙතෙක් මෙම කාර්යාලයේ හානි පාඩු පිළිබඳව වාර්තා නොවූ නිසා හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොමැති අතර, ඉදිරියේදී හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ii) මු රෙ 371 (2) (ආ) | කාර්යාලය විසින් මාණ්ඩලික තත්ත්වයේ නොවන නිලධාරීන් වෙත අවස්ථා 8 කදී එකතුව රු. 571,730 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණු අතර, රු. 100,000 ඉක්මවා අවස්ථා 22 කදී නිලධාරීන් 11 දෙනෙකුට එකතුව රු.11,892,081 ක් වූ අතුරු අග්‍රිම ලබාදී තිබූ අතර, ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන් වෙතම අත්තිකාරම් නිකුත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණු අතර, තත්කාර්ය අතුරු අග්‍රිම සීමාව වැඩිකර දෙන ලෙසට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලීමක් කර ඇති බවද දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (iii) මු රෙ 371 (5) | අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවද, කාර්යාලයේ නිලධාරීන් අවස්ථා 14 ක දී ලබාගත් අතුරු අග්‍රිම පියවීමට දින 21 සිට දින 245 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි අත්තිකාරම් පියවීමේදී ප්‍රමාදයන් නොවන ලෙසට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කළ බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (iv) මු රෙ 1645 (අ) | කාර්යාලය භාවිතා කරන වාහන සඳහා මුදල් රෙගුලාසි පරිදි ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | අධිකරණ අමාත්‍යාංශයට අයත් වාහනයේ අයිතිය මෙතෙක් මෙම කාර්යාලයට පවරා දී නොමැති අතර, එම වාහනයට අදාළ ලොග් සටහන් පොතද, අප වෙත භාර දී නොමැත. ඉතිරි වාහන දෙකට අදාළ ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන යන ලෙසට අදාළ නිලධාරීයාට උපදෙස් දුන්බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (v) මු රෙ 1646 | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සතුව පවතින වාහන තුනක් සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මින් ඉදිරියට ධාවන සටහන් වාර්තා සෑම මසකම 15 දිනට ප්‍රථම එවීමට කටයුතු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (vi) මු රෙ 315,<br>මු රෙ 880<br>2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදය | ඇප තැන්පත් කළ යුතු කාර්යාල නිලධාරින් හඳුනාගෙන එම නිලධාරීන්ගෙන් ඇප මුදල් තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැන්පත් කළ හැකි ආකාරය පිළිබඳ සොයා බලා ඉදිරියේදී සුදුසු පරිදි කටයුතු කිරීමට සටහන් කර ගත් බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඉ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත 16 (2) | පනත ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙවැනි ප්‍රමාදයන් සිදු නොවීමට වගබලා ගැනීමට සටහන් කර ගත් බව දන්වා තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,463,248 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 5,466,061 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,813 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ලැබීම්වල රු.8,735,756 ක වැඩිවීම , පුද්ගල වියදම්වල රු.1,214,491 ක අඩුවීම, සැපයුම් හා පරිභෝජන වියදම්වල රු.914,475 ක වැඩිවීම සහ සේවා වියදම රු.8,581,574 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2022 අප්‍රේල් 26 දිනැති රාජ්‍ය වියදම් පාලනයට සම්බන්ධ ජාතික අයවැය චක්‍රලේඛ අංක 2022/03 හි 2 ඡේදයට අනුව රාජ්‍ය වියදම් සීමා කිරීම රාජ්‍ය ආයතන විසින් දැඩිව අනුගමනය කළ යුතු යැයි සඳහන් කර තිබුණද, ඊට පටහැනි වියදම්ද ඇතුළුව ප්‍රාදේශීය කාර්යාල පහක් සඳහා කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ දී රු.20,629,346 ක වියදම් දරා තිබුණු අතර, වර්ෂය තුළදී මෙම ප්‍රාදේශීය කාර්යාල සඳහා පැමිණිලි 274 ක් පමණක් සටහන් කර ගැනීම සිදුකර තිබුණි. | මෙම ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමේ අරමුණ වූයේ එම ප්‍රදේශයන්හි ජනතාවට ඍජුවම තම ගැටළු අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමේ පහසුව ලබාදීම වුව ද, මෙම ප්‍රාදේශීය කාර්යාල පවත්වාගෙන යෑමේ වියදම අවමකිරීමේ පරමාර්ථයෙන් ඒ සඳහා රජයේ ගොඩනැගිල්ලක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් කටයුතු කරනු ලබනු අතර, මේ පිළිබඳව දැනටමත් අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ සාකච්ඡා කර ඇති අතර, තවදුරටත් මේ පිළිබඳව අවශ්‍ය කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | චක්‍රලේඛවලට අනුගත වෙමින් කටයුතු කළ යුතු ය. |
| (ආ)මඩකලපුව හා මාතර ප්‍රාදේශීය කාර්යාල සඳහා රු.100,000 ක හා රු.150,000 මාසික කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල 2022අගෝස්තු හා ජුනි මස බදු ගිවිසුම් අවසන් වුව ද, නැවත බදු ගිවිසුම් අලුත් කිරීමට හෝ වෙනත් ගොඩනැගිලිවලට මාරුවීමට කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. | මෙම ප්‍රාදේශීය කාර්යාල රජයේ ගොඩනැගිල්ලකට ගෙනයෑම සඳහා අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් විමසීම් කර ඇතත්, මෙතෙක් ඒ සඳහා පිළිතුරු ලැබී නොමැති අතර, මෙම ප්‍රාදේශීය කාර්යාල රජයේ ගොඩනැගිලිවලට ගෙනයෑමේ බලාපොරොත්තුවෙන් තවදුරටත් දිස්ත්‍රික් ලේකම්වරුන් සමග සාකච්ඡා කරනු ලබන බව දන්වා තිබුණි. | වියදම් අවම වන ආකාරයෙන් කටයුතු කිරීමට වගබලා ගත යුතු ය. |

| | | |
|---|---|---|
| (ඇ)2022 වර්ෂය තුලදි රු.9,000,000 ක් වැයකර විමර්ශන අංශයේද සහයෝගය සමඟ විමර්ශන පැවැත්වීම සහ ලිපිගොනු 9000 ක් යාවත්කාලීන කිරිමට සැලසුම් කර තිබූ අතර, මින් වර්ෂය අවසාන වන විට රු.20,580,368 ක් වැයකර ලිපිගොනු 2389 ක් පමණක් යාවත්කාලීන කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කළ මුදලට වඩා සියයට 226 කින් සත්‍ය මුදල වැඩි වී තිබූ අතර, ඒ අනුව නිසියාකාරයෙන් මුදල් ඇස්තමේන්තු කිරීමක් සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ රටේ පැවති නොසන්සුන්තාවය, ඉන්ධන හිඟය, භාණ්ඩ හා සේවාවල මෙන්ම ප්‍රවාහන ගාස්තු විශාල ලෙස ඉහල යාම නිසා ඇස්තමේන්තු මුදලට වඩා තථ්‍ය වියදම වැඩිවූ බව දන්වා තිබුණි. | වියදම් අවම වන පරිදි ඇස්තමේන්තු සකස් කළ යුතු ය. |
| (ඈ)කාර්යාලයේ මානව සම්පත් හා පාලන අංශය විසින් නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට රු.148,638 ක මුදලක් ගෙවා තිබුණද, වර්ෂය තුළ කිසිදු විභාගයක් පවත්වා නොතිබුණි. | කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සඳහා අත්තිකාරම් වශයෙන් රු.148,638 ක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට ගෙවා තිබුණ ද, විවිධ හේතූන් මත 2022 වර්ෂය තුලදී විභාග පවත්වා නොතිබූ බව දන්වා තිබුණි. | නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත කාලවලදී පවත්වා ගැනීමට කටයුතු කළ යුතු ය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාලය විසින් 2022 වර්ෂය තුළ ගොඩනැඟිලි කුලී ලෙස රු.22,377,622 ක් බාහිර පාර්ශවයකට ගෙවා තිබුණු අතර, මීට අමතරව මෙම ගොඩනැඟිල්ල සඳහා වර්ෂය තුළ පිරිසිදු කිරීමේ සේවා ගාස්තු, ආරක්ෂක සේවා, පවිත්‍රතා කටයුතු, ජලය හා විදුලිය ලෙස රු.4,620,934 ක් ගෙවා තිබුණි. මෙම වියදම් නිලධාරින් 15 ක් වැනි සුළු සංඛ්‍යාවක් වෙනුවෙන් දරන ලද වියදම් බව නිරීක්ෂණය විය. | 2023 ජනවාරි මස සිට මෙම කාර්යාලය අධිකරණ, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත රැගෙන ඒම නිසා බදු කුලිය, විදුලිය හා ජලය සඳහා වන වියදම් විශාල වශයෙන් අඩු වී ඇති බව දන්වා තිබුණි. | රජයේ වියදම් අවම වන පරිදි කටයුතු කිරීමට වගබලා ගත යුතු ය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)අනුමත කාර්ය මණ්ඩලය තුළ භාෂා පරිවර්තකයින් 7 දෙනෙකු සිටියද, එක් අයෙකු හෝ බඳවා නොගැනීම හේතුවෙන් 2022 වර්ෂයේදී බාහිරව තෝරාගත් භාෂා පරිවර්තකයින් දස දෙනෙකු වෙත රු.3,082,880 ක මුදලක් භාෂා පරිවර්තන ගාස්තු ලෙස ගෙවා තිබුණි. | භාෂා පරිවර්තකයින් බඳවා ගැනීමට සූදානම් කර තිබුණද, නව බඳවාගැනීම් නවතා දැමීමේ රජයේ ප්‍රතිපත්තිය යටතේ බඳවා ගැනීමට නොහැකි වූ නිසා අධිකරණ අමාත්‍යාංශයේ උපදෙස් පරිදි මිල ගණන් කැඳවා සුදුසු භාෂා පරිවර්තකයින් තෝරාගෙන රජයේ චක්‍රලේඛයට අනුව ගෙවීමේ පදනම මත අදාළ ගොනු පරිවර්තනය කරගත් බව දන්වා තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| (ආ)කාර්යාලය ආරම්භයේදී නිලධාරීන් 255 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණ ද, මෙම ආයතනයේ කටයුතු වර්තමානය වන විට නිලධාරීන් 31 ක් වැනි අවම සංඛ්‍යාවක් මඟින් කළමනාකරණය කරගනු ලබන බැවින් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට නොහැකිවීම නිසා බොහෝ කටයුතු පුහුණුලාභීන් විසින් සිදු කරන අතර, සන්නිවේදන හා සමාජ සම්බන්ධීකරණ අංශය සහ සෙවීම් හා විමර්ශන අංශයටද දැනට නිලධාරීන් නොමැති නිසා ඒවා ක්‍රියාත්මක නොවීම මත විෂය පථය සීමා වී ඇති බව දන්වා තිබුණි. | අනුමත කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට හෝ සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර ඇති තිබුණද, ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අනුගමනය කරමින් ගිණුම් පිළියෙල කර ඇති බව 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වාර්තාවේ සඳහන් කර ඇති බව දන්වා තිබුණි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු ය. |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය හා කර්තව්‍ය ඉටු කිරීම) පනතේ II කොටසේ 10 (1) හි දැක්වෙන කාර්යභාරයන් ඉටුකිරීම සඳහා කාර්යාලයේ ප්‍රධාන අංශ 3 ක් වන සෙවීම් හා විමර්ශන, සන්නිවේදන හා සමාජ සම්බන්ධීකරණ සහ මුදල් හා ප්‍රසම්පාදන අංශයන් ඍජුව සම්බන්ධ වුවද, 2022 වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට එම අංශ මඟින් ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන් ඇතුළත් කර නොතිබුණි. ආයතනය පිහිටුවීමේ මූලික පරමාර්ථය ඉටුකර ගැනීමට අත්‍යාවශ්‍ය වන මෙම අංශ ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | සෙවීම් හා විමර්ශන, සන්නිවේදන හා සමාජ සම්බන්ධීකරණ යන අංශයන්හි අංශ ප්‍රධානීන් නොමැතිවීමත් එම අංශයන්ට අදාල නිලධාරීන් බඳවාගැනීමට නොහැකිවීමත් නිසා ක්‍රියාකාරී සැලැස්මට මෙම අංශවල ක්‍රියාකාරකම් ඇතුළත් නොකරනලද නමුත්, ප්‍රධානීන් නොමැතිවුවත්, එදිනෙදා රාජකාරීන් අනෙකුත් නිලධාරීන් මගින් ඉටුකරවා ගත්බව දන්වා තිබුණි. | ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු ය. |
| (ආ)කාර්යාලය පිහිටුවීමට අදාළ පනතේ ප්‍රධාන කාර්යයන් අතරට අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධ සිදුවීම් පිළිබඳ නිසි ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාළ බලධාරියා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම හා අතුරුදහන් වූ තැනැත්තන් සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් හා බැඳීම් ආරක්ෂා කිරීම ඇතුළත් වුවද, කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දක්වා ලැබී තිබූ පැමිණිලි ගණන 14,988 ක් වූ අතර, එදිනට විසඳන ලද | ජාත්‍යන්තර සම්මුතීන් ප්‍රඥප්ති සහ අන්තර්ජාතික මානව හිමිකම් නීතියට අදාළව සංක්‍රාන්ති යුක්තිය ඉටුකරමින් ජාතික සංහිඳියා යාන්ත්‍රණය ඉෂ්ඨ සිද්ධ කරගැනීම උදෙසා අර්ධ අධිකරණයම ස්වරූපයෙන් කරන්නා වූ විමර්ශන ක්‍රියාවලිය 2022 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර, විමර්ශන පැවැත්වීමට අවශ්‍ය විමර්ශන මණ්ඩල ක්‍රමය හඳුන්වා | විමර්ශනය කරනු ලබන පැමිණිලි ගණන වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| පැමිණිලි ගණන 2389 ක් විය. ඒ අනුව ලැබී තිබූ මුළු පැමිණිලි ගණන හා සසඳන විට විමර්ශනය කරන ලද පැමිණිලි ගණන සියයට 15 ක වැනි අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | දී ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනද සලසා ගන්නා ලද්දේ 2022 වර්ෂය තුළදීය. ඒ අනුව 2022 වර්ෂය තුළ විමර්ශන පැවැත්වීම ආරම්භ කරන ලද බව දන්වා තිබුණි. | |
| (ඈ)2022 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබූ රු.5,425,000 ක් වූ කාර්යයන් 15 ක ට අදාළව කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර නොතිබුණි. කාර්යාලයේ අංශ 5කට අදාල කාර්යයන් 21 ක් සඳහා නිසියාකාරයෙන් ඇස්තමේන්තු කිරීමක් කර නොතිබූ අතර, එහි ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ පැවති කොවිඩ් වසංගතයත් සමඟ රජය විසින් පනවන ලද සංවරණ සීමා සහ ඉන්ධන හිඟයට අතිරේකව මෙම කාර්යාලයේ මෙතෙක් පවතින කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු නිසා සැලසුම් කරන ලද කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටු කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කිරීමට වගබලා ගත යුතු ය. |

## 4.3 විගණන කමිටුව

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයෙහි 04 පරිච්ඡේදය ප්‍රකාරව අවම වශයෙන් විගණන කමිටු මාස තුනකට එකක් බැගින් පැවැත්විය යුතු වුවත්, කාර්යාලය විසින් එසේ කර නොතිබුණි. | මේ සඳහා අවශ්‍ය නිලධාරියකු දැනට නොමැති අතර, ඒ සම්බන්ධව සොයා බලා සුදුසු පරිදි කටයුතු කිරීමට සටහන් කරගත් බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව විගණන කමිටු පැවත්විය යුතු ය. |